**බේරුවල ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 13 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බේරුවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.6,165,738 ක් ණය හිමියන් යටතේ දක්වා නොතිබුණි. | ණයහිමි වටිනාකම නිවැරදිව වෙන් කල යුතුය. | 2019 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවේ ජර්නල් මගින් නිවැරදි කර ගිණුම්ගත කර සියළුම ණයහිමි සටහන් කර ඇති බව දන්වමි. |
| (ii) | විදුලි ගබඩා ගිණුමේ අයිතම 07 ක අවසන් තොග ශේෂය රු.121,075 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි ශේෂය ගිණුම් ගත කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | 2019 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ රු.22,426,671ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2019 දෙසැම්බර් 31 දිනට රු.167,475 ක් වූ කර්මාන්ත ගබඩා තොගය ගිණුම්ගත කර නො තිබුණි. | සියළුම තොගයන් ගිණුම් ගත කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (v) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.2,801,906 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | තොග සමීක්ෂණයක් මගින් අවශ්‍ය ගැලපීම් කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (vi) | ස්ථාවර වත්කම් ලේඛනයේ තිබූ ඉඩම් කැබලි 92 ක් සහ පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන හා යන්ත්‍රෝපකරණ අයිතම 05ක පිරිවැය හඳුනාගෙන ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළුම වත්කම් ගිණුම් ගත කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවලට අනුව සේවක ණය ශේෂය රු. 19,625,031 ක් වුවද , ලේඛන අනුව ශේෂය රු. 19,927,732 ක් වුයෙන් රු.302,701 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උපලේඛන නොමැතිවීම නිසා එකතුව රු.63,763,990 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | උපලේඛන වලින් ශේෂයන් සනාථ කළ යුතුය. | ඉදිරියේදී සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම්

------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ<br>(i) 21 වගන්තිය | - | සභාව සතු මාර්ග ග්‍රාම සේවා වසම් අනුව හඳුනාගැනීමක් කර නොතිබුණි. | සභාව සතු මාර්ග ග්‍රාම සේවා වසම් අනුව හඳුනාගෙන මිණුම්කල යුතුය. | ඉදිරියේදි අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බව දන්වමි. |
| | (ii) 134(1) වගන්තිය | | වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | වරිපනම් සඳහා වන හඳුනාගැනීම් සිදුකල යුතුය. | අවශ්‍ය කටයුතු සඳහා යොමුකර ඇති අතර ඉදිරියේදි ඒ සම්බන්ධව ක්‍රියා කරන බව දන්වමි. |
| | (iii) 147 හා 149 වගන්ති | | වරලත් ගණකාධිවරයෙකු විසින් සහතික කරන ලද ගිණුම් කට්ටල නොගෙන හෝටල් 11 කින් බලපත්‍ර ගාස්තු ලබාගෙන තිබුණි. | වරලත් ගණකාධිකාරිවරයෙකු විසින් සහතික කරන ගිණුම් කට්ටලයක් මත ගාස්තු අයකළ යුතුය. | වරලත් ගණකාධිකාරි සහතික කල ගිණුම් කට්ටල අනුව බලපත්‍ර ලබා දි ඇති බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i)මුදල් රෙගුලාසි 104 | 107,830 | කායවර්ධන මධ්‍යස්ථානය වෙනුවෙන් මිලදී ගෙන තිබුණ භාණ්ඩ අයිතම 06 ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | පරීක්ෂණයක් කර වාර්තාව ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය - | ව්‍යාපාර ආයතන 16 ක පරිසර බලපත්‍රවල කාල සීමාව ඉකුත් වුවද, නව බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | පරිසර බලපත්‍ර නිකුත් කළ යුතුය. | නව බලපත්‍ර ලබා ගැනීමට ක්‍රියා කරන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව දන්වමි. |

2 මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.53,767,301 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.38,032,903 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 29,405,717 | 30,469,726 | 27,381,982 | 32,493,461 | 21,601,133 | 26,610,745 | 19,312,803 | 28,899,074 |
| (ii) | කුලී | 25,209,515 | 19,221,794 | 17,655,964 | 26,775,344 | 21,609,208 | 21,217,625 | 24,357,018 | 18,469,815 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 7,449,820 | 2,126,570 | 2,100,570 | 7,475,820 | 46,072,220 | 4,716,130 | 4,726,130 | 46,062,220 |
| (iv) | වෙනත් ආදායම් | 128,273,445 | 84,600,000 | 63,184,250 | 149,689,195 | 46,925,713 | 43,600,000 | 96,022,118 | -5,496,405 |
| | | 190,338,497 | 136,418,090 | 110,322,766 | 216,433,820 | 136,208,274 | 96,144,500 | 144,418,069 | 87,934,704 |

2.2.2 ආදායම් රුැස් කිරිමේ කාර්ය සාධනය

--------------------------------------------

(අ) වරිපනම් හා බදු

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01-05 ක් අතර ශේෂය රු.6,069,521 ක් වූ අතර වර්ෂ 05 ට වැඩි ශේෂය රු.1,581,346 ක් විය. | හිඟ වරිපනම් ආදායම කඩිනමින් අයකර ගත යුතුය. | විවිධ ක්‍රියා මාර්ග ගෙන හිඟ වරිපනම් අයකර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) ව්‍යාපාර බදු

--------------

| | | |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟ ව්‍යාපාර බදු රු.648,120 ක් වූ අතර එහි වර්ෂ 01 අඩු හිඟය රු.390,520 ක් , වර්ෂ 01-03 ත් අතර හිඟය රු.212,400 ක් සහ වර්ෂ 03-05 අතර හිඟය රු.45,200 ක් විය. | හිඟ ව්‍යාපාර බදු කඩිනමින් අයකර ගත යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ii) ව්‍යාපාර බදු අදාල වර්ෂය ආරම්භයේදී අයකල යුතු වුවත්, දර්ගා නගරය උපකාර්යාලයේ 2013 සිට 2018 දක්වා පැවති හිඟය රු.161,760 ක් විය. | හිඟ ශේෂ අයකිරීමට කටයුතු කල යුතුය. | සමහර ව්‍යාපාර වලින් අයකර ගැනීමට කටයුතු කර තිබුණු අතර අයකල නොමැති ව්‍යාපාර වලින් අය කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

(ඇ) කඩකුලි

----------

| | | |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01-05 ත් අතර හිඟ කඩ කුලිය රු.3,355,830 ක් විය. | දීර්ඝ කාලීන හිඟ කඩකුලී අයකර ගත යුතුය. | හිඟ කඩකුලී අයකර ගැනීමට නිත්‍යානුකූලව කටයුතු කරන බව දන්වමි. |
| (ii) වෙළඳ කටයුතු පවත්වාගෙන යන කඩ කාමර 28 ක ගිවිසුම් කාලය අවසන්වීම මත 2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් දක්වා අයවිය යුතු රු.1,793,115 ක හිඟ කඩකුලීය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කල යුතුය. | නිත්‍යානුකූලව කටයුතු කරන ලෙස උපදෙස් දී ඇති අතර ඇතැම් කඩ කාමර වසා ඇති බව දන්වමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.31,007,602 ක් හා මුද්දර ගාස්තු රු.79,000,869 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුය. | අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇති බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ක්‍රියාකාරී සැලැස්ම** | | |
| සමාලෝචිත වර්ෂය තුළ පිරිවැය රු.මි.22.9 වූ ව්‍යාපෘති 144 ක් ක්‍රියාකාරී සැලැස්මට පරිබාහිරව ක්‍රියාත්මක කර තිබුණු අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මිණුම් කිරීමක් සිදු කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති ඉටුකල යුතුය. | ව්‍යාපෘති සභා අනුමැතිය මත ක්‍රියාත්මක කර තිබූ බව දන්වමි. |
| **(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| සභාව සතු කොම්පෝස්ට් අංගනයක් පැවතියද දිරන කසළ බැහැර කිරීම සඳහා සේවා ගිවිසුමක් මගින් බාහිර පාර්ශවයන් වෙත කොන්ත්‍රාත් ලබා දී තිබුණි. එහෙත් වගන්ති ඇතුලත් කර ගිවිසුමක් අත්සන් නොකිරීම නිසා අවශ්‍යතාවයන්ට පරිබාහිරව පස් දැමීම හා මැසි නාශක වෙනුවෙන් ලක්ෂ 56 කට වැඩි වියදමක් දරා තිබුණි. | ගිවිසුම් අත්සන් කිරීමේදී ගිවිසුම් වගන්ති විධිමත්ව ඇතුලත් කර පස් හා මැසි නාශක භාවිතා කල යුතුය. | ගිවිසුම් ප්‍රකාරව පස් හා මැසි නාශක භාවිතා කර ඇති බව දන්වමි. |
| **(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක** | | |
| (i) සමාලෝචිත වර්ෂය තුල තිරසර සංවර්ධන සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ රු.මි.1.5 ක පිරිවැය වූ ක්‍රියාකාරකම් 06 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |
| (ii) ක්‍රියාකාරකම් 05 ක් ඉටුකර තිබුණ ද එහි දර්ශක අනුව නිමවුම හා ප්‍රතිලාභීන් හඳුනාගෙන ප්‍රගතිය වාර්තා කිරීම් විධිමත්ව සිදු කර නොතිබුණි. | තිරසර සංවර්ධන ප්‍රගතිය හඳුනාගෙන මිණුම් කළ යුතුය. | ඉදිරියේදී ප්‍රගතිය වාර්තා කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නව වෙළඳ සංකීර්ණය අංක 05 කඩයේ ගිවිසුම්ගත බදුකරු 1999 වර්ෂයේ මියයැමෙන් පසුව එම කඩ කාමරය සභාව වෙත පවරා නොගෙන වලංගු ගිවිසුමක් ද නොමැතිව වෙනත් පුද්ගලයෙකු වෙත කඩකුලී අයකිරීමකින් තොරව ලබා දී තිබුණි. | කඩ කාමර බදු දීමේදී විධිමත් පරිදි කටයුතු කළ යුතුය. | 1999 වර්ෂයේදී ගිවිසුම් ගත වී ඇති බව දන්වමි. |
| (ආ) සභාව සතු කඩ කාමර 60 ක් 2019 දෙසැම්බර් අවසන් වන විටත් බදු දීමට කටයුතු කර නොතිබුණි. | බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී කඩ කාමර වැඩි දියුණු කර බදු දීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) සියළුම ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ගාස්තු අය කර නොතිබුණි. | දැන්වීම් පුවරු සමීක්ෂණ සිදු කර ගාස්තු අයකළ යුතුය. | ඇතැම් දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකර ඇති අතර ගාස්තු අය නොකල පුවරු සඳහා අයකර ගැනීමට අවශ්‍ය උපදෙස් දී ඇති බව දන්වමි. |
| (ඈ) කාර්යාල කටයුතු පරිගණක ජාලගත කිරිම සඳහා 2018 මාර්තු මස රු.4,645,000 ක වියදමක් දරා මෘදුකාංගය පද්ධතිය මිලදීගෙන තිබුණ ද, 2020 පෙබරවාරි 19 දින වන විටත් ජාලගත කිරීම් සිදු කර නොතිබුණි. | මෘදුකාංග පද්ධතිය ජාලගත කිරිම කඩිනමින් සිදු කළ යුතුය. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු පිරවිමට කටයුතු කල යුතුය. | වැඩ බලන ලේකම්වරයෙකු සේවයේ නියුක්ත වන බව දන්වමි. |
| (ආ) අනුමතව තිබු ආයුර්වේද වෛද්‍ය තනතුරු දෙකෙන් එක් තනතුරක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු පිරවිමට කටයුතු කල යුතුය. | පුරප්පාඩු සඳහා අවශ්‍ය බලධාරීන්ගෙන් ඉල්ලීම් කර ඇති බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ඇ)ද්විතීය මට්ටමේ තනතුරු 05 ක් වෙනුවෙන් සේවකයින් 10 දෙනෙකුගේ හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් වෙනුවෙන් සේවකයින් 30 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. | ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරිමට කටයුතු කල බව දන්වමි. |
| (ඈ) ආදේශක පදනමින් බඳවා ගෙන ඇති ප්‍රාථමික මට්ටමේ සේවකයින් 61 දෙනෙකු වෙනුවෙන් 2019 වර්ෂයේදි රු.15,518,799 ක මුදලක් සභාව විසින් ගෙවා තිබුණි. | අනුමැයකින් තොරව ගෙවීම් නොකල යුතුය. | සභාවේ කටයුතු සඳහා සිටින සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවූ නිසා සභා අරමුදලින් ගෙවීම් කර තිබූ බව දන්වමි. |
| (ඉ) අනුමත කර තිබූ පෙර පාසැල් ගුරුවරුන් 04 දෙනෙකුගේ පුරප්පාඩු පිරවීමට කටයතු කර නොතිබුණ අතර, ව්‍යාපෘති පදනම මත පෙර පාසැල් ගුරුවරුන් හා ගුරු සහායකයින් 13 දෙනෙකු බඳවාගෙන රු.1,689,395 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු අතර අනුමැතිය මත බඳවාගෙන වැටුප් ගෙවිය යුතුය. | පෙර පාසැල් ගුරුවරුන් බඳවාගෙන අදාල ව්‍යාපෘති වාර්තා සකස් කර සභා අනුමැතිය ලබාගත් බව දන්වමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)ව්‍යාපාරික කටයුතු කරගෙන ගොස් තිබූ හෝටල් ආයතන 16 කින් සමාලෝචිත වර්ෂයට බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | හෝටල් සමාගම් වලින් ව්‍යාපාර කටයුතු කිරිමේදී බලපත්‍ර ගාස්තු අය කල යුතුය. | උපලේඛන සඳහා අනුමැතිය ලබාදීමේ ප්‍රමාද නිසා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට නොහැකි වුවද, ඉදිරියේදී අයකිරිමට කටයුතු කරන බව දන්වමි. |

3.5 නිශ්ක්‍රිය/ ඌණ උපයෝජන වත්කම්
----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)ප්‍රධාන කාර්යාලය හා උපකාර්යාල 05 සඳහා 2017 වර්ෂයේදී රු.570,000 ක මුදලක් වැය කර මිලදී ගත් ඇඹිළි සළකුණු යන්ත්‍ර සියල්ලම 2019 වර්ෂයේ සිට අක්‍රියව පැවති අතර රු.650,000 ක් ගෙවා මිලදී ගෙන තිබූ ඩුප්ලෝ යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබුණි. | එම වත්කම් අදාල කාර්යයන් සඳහා යොදාගත යුතුය. | පරීක්ෂණයන් පවත්වා වාර්තාවන් කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ආ) ඍැනසල මධ්‍යස්ථානයේ භාණ්ඩ අයිතම 30 ක් 2020 පෙබරවාරි අවසන් වන විටත් නිශ්ක්‍රියව පැවතුණි. | උපයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. | අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ ගබඩාව වෙත ලබා දීමට කටයුතු කර ඇත. |
| (ඇ) කායවර්ධන මධ්‍යස්ථාන තුන සඳහා උපදේශකයන් බඳවා නොගැනීම නිසා 2018 වර්ෂයෙන් පසුව අවස්ථා කිහිපයකදී වසා දැමීම හේතුවෙන් රු.19,476,880 ක වියදමක් දරා විවෘත කර තිබූ මෙම මධ්‍යස්ථාන වලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනිමට නොහැකි වී තිබුණි. | එම මධ්‍යස්ථානයට අවශ්‍ය සම්පත් ලබා ගනිමින් එය භාවිතා කිරිමට කටයුතු කල යුතුය. | පුහුණුකරුවන් බඳවා ගැනීමට නොහැකි වීම මීට හේතු වු බව දන්වමි. |

3.6 වාහන උපයෝජනය

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සර්හිත වාහන 03 ක් අපහරණය කිරිම හා තවත් වාහන 02 ක් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2018 වර්ෂයේ අලුත්වැඩියාව කිරීම සඳහා භාරදී තිබූ ට්‍රැක්ටර් රථය 2020 පෙබරවාරි වන විටත් අළුත්වැඩියාව නිමකර නොතිබුණි. | අපහරණය කිරිම් හා අලුත්වැඩියා කිරිම් සිදු කිරීමට කටයුතු කල යුතුය. | අපහරණය කිරීමට හා අලුත්වැඩියා කිරිමට අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |
| (ආ) සභාව සතු වාහන 31 න් වාහන 27 ක ආදායම් බලපත්‍ර 2020 පෙබරවාරි අවසන් වන විටත් ලබාගෙන නොතිබුණ අතර වාහන 04 ක රක්ෂණ සහතික ලබා නොගෙන ධාවන කටයුතු සඳහා යොදවා තිබුණි. | ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගෙන වාහන ධාවනය කල යුතුය. | අළුත්වැඩියාව සඳහා භාරදුන්නද එහි ප්‍රමාදය මත නැවත ඒ සඳහා භාරදී අදාල කටයුතු සිදු කරන බව දන්වමි. |

3.7 වාර්ෂික භාණ්ඩ /තොග සමීක්ෂණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 හා ,2019 වර්ෂයන්ට අදාලව වාහන සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කල යුතුය. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බව දන්වමි. |